# මතුගම අධ්‍යාපන කලාපය

## විද්‍යා විෂය ඒකක සංවර්ධන වැඩසටහන

| 9 ශ්‍රේණිය | පරිණාමික ක්‍රියාවලිය | ඒකකය - 09 |
|---|---|---|

01) විශ්වයේ උපත පිළිබඳ පවතින විවිධ මතවාද අතරින් මුල්ම විද්‍යාත්මක වාදය

1. ස්වයං සිද්ධ වාදය
2. නේබියුලා වාදය
3. මහා පිපිරීමේ වාදය
4. කොස්මොසොයික් වාදය

02) පෘථිවිය මධ්‍යයේ තිබූ විවිධ මූලද්‍රව්‍ය එකිනෙක අතර ප්‍රතික්‍රියා කර විවිධ වායුවර්ග හට ගැණුනි. පෘථිවියේ මුල්ම වායුගෝලයේ අඩංගු නොවන වායු වර්ගය වන්නේ,

1. ඔක්සිජන්
2. කාබන්ඩයොක්සයිඩ්
3. මෙතේන්
4. හයිඩ්‍රජන් සල්ෆයිඩ්

03) ස්වයං සිද්ධි ජනන වාදය සත්‍ය නොවන බව තහවුරු වූයේ කුමන විද්‍යාඥයාගේ පරීක්ෂණය නිසාද?

1. ස්ටැන්ලි මිලර්
2. ලුවී පාස්චර්
3. චාලිස් ඩාවින්
4. හැල් ඩේන්

04) A ආරම්භක බහුසෛලික ජීවීන් ලෙස නිඩාරියාවන් ඇතැම් ඇනෙලිඩාවන් හා මුල්ම ආත්‍රෝපෝඩාවන් සැලකේ.

B ජෛව පරිණාමයේදී පක්ෂීන් හා ක්ෂීරපායින් උභය ජීවීන් ගෙන් සම්භවය වූ බව විශ්වාස කෙරේ

C ප්‍රභාසංසංස්ලේශී ඇල්ගී ක්‍රමිකව වෙනස්වීමෙන් ශාකලෝකය නිර්මාණය විය

ඉහත ප්‍රකාශ අතරින් සත්‍ය වන්නේ

1. A පමණි
2. Bපමණි
3. Aහා B පමණි
4. A හා C පමණි

05) නූතන මානවයාගේ ආරම්භය සිදුවී ගතවී ඇති වර්ෂ ගණන

1. වසර මිලියන 3.5 ක් පමණ
2. වසර මිලියන 12 ක් පමණ
3. වසර මිලියන 5 ක් පමණ
4. වසර මිලියන 1 ක් පමණ

06) ජීවමාන පොසිලයකට උදාහරණයකි

1. මැමත්
2. ඩයිනසෝර්
3. බත්කූරා
4. අශ්වයා

07) පරිණාමික ක්‍රියාවලියේදී කලින් පැවති ජීවී විශේෂයකින් නව ජීවී විශේෂ ඇතිවීම හඳුන්වන්නේ

1. ජෛවවිවිධත්වය
2. විශේෂ ප්‍රාප්තිය
3. පරිණාමය
4. ජීවමාන පොසිල

08) ආරම්භක සරල ජීවීන්ගේ සිට වර්තමාන සංකීර්ණ ජීවීන් දක්වා ක්‍රමිකව විකාශනය හැඳින්විය හැක්කේ

1. ජෛවවිවිධත්වය
2. විශේෂ ප්‍රාප්තිය
3. ජීවයේ සම්භවය
4. පරිණාමය

09) පරිණාමික ක්‍රියාවලිය පිළිබඳව සම්පූර්ණ පොසිලමය සාක්ෂි සහිත ජීවියකු ලෙස සැලකන්නේ

1. අශ්වයා
2. බත්කූරා
3. ලාම්පු බෙල්ලා
4.සිලාකැන්ත්

10) මානව පර්ණාමය පිළිබඳව ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන සාක්ෂි ඇති ප්‍රදේශයක් නොවන්නේ

1. ඉබ්බන් කටුව
2. බට දොඹ ලෙන
3. රාවණා ඇල්ල
4. තඹලගමුව බොක්ක

## B කොටස - රචනා

01) මීට වසර බිලියන 4.5 කට පෙර පෘථිවියේ සම්භවය සිදුවූ බව සැලකේ.

i. පෘථිවියේ සම්භවය පිළිබඳව ඉදිරිපත්වූ නූතන වාදයේ නම කුමක්ද? (ල 2)

ii. එම වාදයට අනුව අපගේ සෞරග්‍රහ මණ්ඩලය පිහිටි චක්‍රාවාටයේ නම කුමක්ද? (ල 2)

iii. පෘථිවි ග්‍රහයාගේ සම්භවය පිළිබඳ ඔබ ඉහත නම් කළ මතය සරලව සඳහන් කරන්න. (ල 3)

iv. පෘථිවියේ සාගර නිර්මාණය වූ ආකාරය විස්තර කරන්න. (ල 3)

02) පෘථිවිය මත ජීවයේ සම්භවය පිළිබඳ විවිධ මත වාද ඇත.

i. ඒ පිළිබඳව ඇති මතවාද 4ක් නම් කරන්න. (ල 4)

ii. පෘථිවිය මත ජීවයේ සම්භවය පිළිබඳ දැනට පිළිගන්නා වාදය ඒ අතරින් කුමක්ද? (ල 2)

iii. ජීවය සෑදීමට අවශ්‍ය අමුද්‍රව්‍ය වැසි ජලයේ දියවී සාගරයට එකතු විය. සාගරවලට පැමිණි මෙම මිශ්‍රණය හඳුන්වන නම කුමක්ද? (ල 2)

iv. මුල්ම ජීවී සෛල හඳුන්වන නම කුමක්ද? (ල 2)

03) පෘථිවයෙ මත බිහිවූ මුල්ම ජීවීන් කාලයක් සමඟ වෙනස් වී සංකීර්ණ බවට පත්වී ඇත.

i. පරිණාමය සරලව හඳුන්වන්න. (ල 3)

ii. පරිණාමය පිළිබඳව නිගමනවලට පැමිණීමේදී සලකා බලන සාක්ෂි 3ක් ලියන්න. (ල 3)

iii. එම සාක්ෂි අතරින් වැදගත්ම සාක්ෂි ලැබෙන්නේ කුමක් මගින්ද? (ල 2)

iv. යම් ආකාරයකට සංරක්ෂණය වූ ජීවියකුගේ දේහ කොටස් ඔවුන්ගේ පා සලකුණු ආදිය පොදුවේ හඳන්වන නම කුමක්ද? (ල 2)

04) පරිණාමික ක්‍රියාවලියේදී කලින් පැවති ජීවී විශේෂයකින් නව ජීවී විශේෂ ඇතිවීමද සිදුවිය හැකිය.

i. පරිණාමවාදයේ පියා ලෙස සැළකෙන්නේ කවුද? (ල 2)

ii. ජීව මාන පොසිල යනු මොනවාදැයි හඳුන්වන්න. (ල 3)

iii. ජීව මාන පොසිල සඳහා උදාහරණ 3ක් ලියන්න. (ල 3)

iv. පෘථිවියෙන් තුරන්ව ගිය නමුත් පොසිල සොයාගෙන ඇති ජීවීන් සඳහා උදාහරණ 2කි ලියන්න. (ල 2)